**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - 2019**

-------------------------------------------------------------

**1.1 අභිතකර මතය**

-----------------

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් කාර්යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අභිතකර මතය සඳහා පදනම**

--------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා විසින් මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් **අභිතකර** විගණන මතයක් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කාර්යාංශය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් කාර්යාංශය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ට අනුකූල නොවන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබීම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් දක්වා තිබුණු මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය රු.මිලියන 1,010 කින් වැඩියෙන් දක්වා තිබීම නිසා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය විගණනයේදී පිළිගත නොහැකි විය. | සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය මේ වන විට පිළියෙල කර ඇති අතර ඉදිරි වර්ෂයේ සිට මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙවැනි දෝෂ ඇති නොවීමට කටයුතු කරමි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍ර හා යන්ත්‍රාගාර, විදුලි උපකරණ හා ක්ෂේත්‍ර උපකරණ යන වත්කම් ප්‍රත්‍යාගණනය කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 90 ඡේදය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට මෙවැනි දෝෂ ඇති නොවීමට කටයුතු කරමි. | - එම - |
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට කාර්යාංශයට විරුද්ධව බාහිර පාර්ශව විසින් නඩු 46 ක් හා බාහිර පාර්ශවයන්ට විරුද්ධව කාර්යාංශය විසින් නඩු 14 | ඉදිරියේදී ගිණුම් ප්‍රකාශන සමඟ හෙළි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | - එම - |

| | | | |
|---|---|---|---|
| | ක් පවරා තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව අදාල අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 15 ඡේදය ප්‍රකාරව තොගවල ශුද්ධ උපලබ්ධි අගය හඳුනා ගැනීමකින් තොරව අවසන් තොගයෙහි අගය එහි පිරිවැයට රු.33,314,238 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ සිට කාර්යාංශයේ පවතින තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට ගිණුම් ගත කිරීමට කටයුතු යොදනු ඇත. | - එම - |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ 10 ට පටහැනිව, රාජ්‍යභාග ආදායම මුදල් පදනම මත හඳුනාගෙන රු. මිලියන 2,477 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර ප්‍රමිතයේ 39(අ) ඡේදය ප්‍රකාර රාජ්‍යභාග ආදායම හඳුනා ගැනීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය වාර්තාවල හෙළිදරව් කරද නොතිබුණි. සේවා සැපයීම ඇතුලත් ගනුදෙනුවක සමාප්ති තත්ත්වය සැලකිල්ලට නොගෙන බලපත්‍ර අයදුම්පත් ලබා ගන්නා අවස්ථාවේදී අය කරන ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු එම අවස්ථාවේදීම ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. මෙම නිසා බලපත්‍ර ලබාදීම ප්‍රතික්ෂේප වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 78 කදී රු.996,820 ක් ආපසු ගෙවා තිබුණි. | කැණීම් බලපත්‍ර වලට අදාළ නිෂ්පාදන පරිමාව බලපත්‍රලාභීන් විසින් කාර්යංශය වෙත ඉදිරිපත් කරන තෙක් වර්ෂයට අදාල රාජ්‍යභාග පුරෝකථනය කල නොහැක. මෙම ප්‍රායෝගික ගැටලුව හේතුවෙන් කාර්යාංශයට රාජ්‍යභාග උපචිත පදනමෙන් ගිණුම්ගත කිරීමට නොහැක. | - එම - |
| (ඊ) | කල්බදු පදනම මත මිලදී ගත් මෝටර් වාහන 10 කට අදාල අවම කල්බදු ගෙවීම් වටිනාකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 12 ප්‍රකාරව වට්ටම් කර වර්තමාන අගය මත ගණනය කරනු වෙනුවට වට්ටම් නොකරන ලද වටිනාකම වූ රු.102,600,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයේ සිට අදාල නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | - එම - |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 54 ඡේදය ප්‍රකාරව රු.95,060,498 ක් වූ පූර්ව කාල පරිච්ඡේද ගැලපුම් අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ වියදම් රු.1,877,992 ක් පූර්ව කාලපරිච්ඡේද වියදමක් ලෙස දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂවලදී පූර්ව කාලච්ඡේද ගැළපුම් එකිනෙක සලකා බලා අවශ්‍ය පරිදි ගැළපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | - එම - |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 26(1) වගන්තිය අනුව සියළුම ඛනිජ සම්පත් ශ්‍රී ලංකා රජය සතු වන බැවින් කාර්යාංශය එකතු කරනු ලබන රාජ්‍යභාගය ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය. එපරිදි කාර්යාංශය මගින් සමාලෝචිත වර්ෂයේදී මිලියන රු.1,190 ක මුදල කාර්යාංශයේ ආදායමෙන් අඩුකර දක්වනු වෙනුවට ඉදිරියට කල ගෙවීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යාංශයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ. | 2019 සඳහා භාණ්ඩාගාරයට ලබා දීමට වෙන්කර තිබුණේ රුපියල් මිලියන 550 ක් පමණක් වුවද රජයේ අවශ්‍යතා සඳහා අරමුදල් සැපයිය යුතු බැවින් ස්ථාවර තැන්පතුවල ආයෝජන කර තිබූ මුදල් වලින් මෙම මුදල් ලබා දී ඇත. එසේ දුන් මුදල් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සටහන් කිරීමට නොහැකි බැවින් මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව දැනුවත් කර මෙය 2020 වර්ෂය සඳහා කල ගෙවීමක් ලෙස මුදල් ගිණුම්වල සටහන් කිරීමට අනුමැතිය ලබාගෙන ඇත. | නිවැරදි ආකාරයෙන් ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල හා එය පිහිටි ඉඩම මිලදී ගැනීමේ පිරිවැය වූ රු.28,000,000 ඉඩම් හා ගොඩනැගිලි වශයෙන් වෙන වෙනම හඳුනාගෙන ගිණුම්ගත කරනු වෙනුවට ඉඩම් යටතේ ගිණුම්ගත කර තිබූ අතර ගොඩනැගිල්ල සඳහා ක්ෂය වෙන් කරද නොතිබුණි. මිලදී ගැනීමේදී වැය කරන ලද තක්සේරු ගාස්තු, ලියාපදිංචි ගාස්තු හා මුද්දර ගාස්තු එකතුව රු.1,238,200 ක් ප්‍රාග්ධන ගත කරනු වෙනුවට වියදම් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් ගත කිරීමට සටහන් කර ගන්නා ලදී. | අදාළ ගිණුම්වලට ගැලපීමට සහ ගොඩනැගිල්ල සඳහා ක්ෂය වෙන් කිරීමට කටයුතු කල යුතුය . |

### 1.5.4 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඛනිජ ගවේෂණ ආදායම පදනම් කරගෙන දිරිදීමනා ගෙවිය යුතු වුවත් රු.13,588,600 ක ක්ෂේත්‍ර පරීක්ෂණ ආදායම් හා රු.4,812,000 ක පරීක්ෂණ පිපුරුම් ආදායම්ද පදනම් කරගෙන රු.111,592,069 ක දිරි දීමනා ගෙවා තිබුණි. කාර්යාංශය සකස් කර තිබූ කාර්යසාධන දිරිදීමනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හෝ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු.62,482,407 ක දිරිදීමනා කාර්යසාධන ඇගයීමකින් තොරව ගෙවා තිබුණි. | දිරිදීමනා ලබාදීම සඳහා 1996 අගෝස්තු මස 02 දින භාණ්ඩාගාර ලිපි අංක PEI/000/6 (Incentive) මගින් ලබාදී ඇති අනුමැතිය පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබාගෙන ඇත. කාර්යාංශය මෙම දිරිදීමනා ගෙවීම ක්‍රමවත්ව සිදුකර ඇත. | අදාල අනුමැතින් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**1.5.5 ඒකාබද්ධ කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 66 ක එනම්, රු.343,526,929 ක් වූ සමාගමේ මුළු ශුද්ධ වත්කම් වලින් රු.226,727,773 ක හිමිකමක් කාර්යාංශය සතු වුවද සමාගමේ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි . | 2019 වසරේ දී ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමට එහි ගිණුම් වර්ෂය ජනවාරි සිට දෙසැම්බර් ලෙස සංශෝධනය කිරීමට දේශිය ආදායම් දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දී නොතිබුණි. 2020 වසරේදී මේ සඳහා අනුමැතිය ලැබී ඇති බැවින් 2020 වර්ෂයේ සිට කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේ. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අඩමාන ණය ප්‍රතිපාදන රු.5,097,526 ක් වෙළඳ හා ලැබිය යුතු අගයන්ගෙන් අඩුකර දැක්විම වෙනුවට ණය හිමි සහ ගෙවිය යුතු ලෙස වගකීම් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී අඩමාණ ණය ප්‍රතිපාදන ලැබිය යුතු අගයන්ගෙන් අඩුකර දැක්වීමට කටයුතු කරන බව දන්වා සිටිමු. | අඩමාන ණය ලැබිය යුතු අගයෙන් අඩුකර දැක්විය යුතුයි. |

**1.6.2 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශයේ කාර්යභාරය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා 2014 වර්ෂයේ සභාපතිවරයා වෙත රු.1,500,000 ක අත්තිකාරම් මුදලක් නිකුත් කර තිබූ අතර ඊට අදාල කාර්ය ඉටු කර හෝ අත්තිකාරම් මුදල පියවා හෝ නොතිබුණි. | මෙම මුදල අයකර ගැනීම සඳහා මුදල් ලබා ගත් අය පිළිබඳ නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. | අත්තිකාරම් පියවීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත | | | |
| | (i) 52(2) වගන්තිය හා 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට් පත්‍රය මගින් සංශෝධිත 21(අ) වැනි පතල් හා කැණීම් නියෝගය | කැණීම්වලින් අනතුරුව ඉඩම් පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතු වුවද කාර්මික කැණීම් බලපත්‍රලාභීන් 874 දෙනෙකු ලවා එම කාර්ය ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. බලපත්‍රලාභීන්ගෙන් ලබාගෙන තිබූ වටිනාකම රු.156,275,430 ක් වූ වලංගු කාලය මාස 2 සිට වසර 09 ක් දක්වා ඉක්මවා තිබූ බැංකු ඇපකර මුදල් කරගෙන තිබුණද එම මුදල් භූමි පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. | ඉදිරිපත් කර ඇති භූමි ප්‍රතිසංස්කරණ සැලැස්ම අනුව භූමිය කැණීම් කිරීමෙන් පසු පුනරුත්තාපනය කල යුතුය. ඒ සඳහා බැඳීමක් වශයෙන් බැංකු ඇපකරයක් මත ගිවිසුමක් අත්සන් කරනු ලැබේ. නියමිත පරිදි පුනරුත්තාපන කටයුතු සිදුනොකරන බලපත්‍ර ලාභීන්ගේ බැංකු ඇපකර කාර්යාංශය විසින් අත්පත් කරගනු ලබන අතර පුනරුත්තාපනයෙන් පසු අදාල බැංකු ඇපකර මුදාහරිනු ලැබේ. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය . |
| | (ii) 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරන ලද 33 (4) වැනි පතල් හා කැණීම් නියෝගය | පතල් නිෂ්පාදනවල නිශ්චය කල වෙළඳ වටිනාකම, ඉඩදිය හැකි අඩු කිරීම් හා රාජ්‍යභාග ගෙවීම් වැඩපිළිවෙල සඳහා ලේකම්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කර කාර්යයන් සම්බන්ධව කාලීන සංශෝධනයන් සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව අදාල සංශෝධනයන් සිදුකිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී . | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(ආ)** | 2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනතේ 2(ඉ) වගන්තිය | ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර කාර්යාංශය විසින් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් කැණීම් කරන මිනිරන්, ඛනිජ වැලි හා තිරුවානා ඛනිජ සඳහා අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස අපනයනය කෙරෙමින් පැවතුණි. | ඛණිජ සඳහා වටිනාකම් එකතු කිරීම පිළිබඳ ගත යුතු තීරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත .එහිදී ඛනිජ වැලි, මිනිරන් සහ ධමනි තිරිවානා සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලිය සඳහා බලපා ඇති කරුණු අධ්‍යනය කර වාර්තා කිරීම, ඒ සඳහා ඇති බාධා හඳුනා | පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගැනීම, අගය එකතු කිරීමේ ක්‍රියාවලියේ පවතින දුර්වලතා හා එම දුර්වලතාවයන් මගහැරවීම සදහා වන යෝජනා හදුනා ගැනීම, අගය එකතු කිරීම අරඹයා දේශීය ප්‍රවණතාවයන් "ඛණිජ ප්‍රතිපත්ති" වලට ගොනු කිරීමට ප්‍රයන්ත දැරීම සිදුකර ඇත. | |
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 6.2(ඇ) වගන්තිය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ජුලි 05 දිනැති අංක 02/09/01/අමප/2018 දරන ලිපිය | පනත ප්‍රකාරව මාස ½ ක වැටුප පදනම් කරගෙන පාරිතෝෂික ගෙවිය යුතු වුවත් සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගැනීම නිසා 2016-2019 කාලය තුල සේවයෙන් ඉවත් වූ සේවකයන් 21 කට රු.8,352,114 ක් වැඩිපුර ගෙවා තිබූ අතර පාරිතෝෂික ගෙවීම සඳහා සම්පූර්ණ මාසයක වැටුප මත පදනම්ව රු.159,753,034 ක් ප්‍රතිපාදනය කර තිබුණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික ආපසු අයකර ගන්නා ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් 2018 මැයි 10 දින දන්වා තිබුණ ද එම මුදල් ආපසු අයකරගෙනද නොතිබුණි. | කාර්යාංශය පාරිතෝෂික පනත ප්‍රකාරව කටයුතු කර ඇති අතර ඒ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව මගින්ද තහවුරු කර ඇත. ඒ අනුව වැඩිපුර ගෙවීමක් සිදුව නැති බැවින් අයකර ගැනීමක් කල යුතුව නැත. පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාවේදී නිර්දේශ වී ඇත්තේ ද අදාල සියළු අනුමැතීන් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලෙසය. මේ වන විට එම කටයුතු සිදු කරමින් පවතී. | පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට හා වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 2(1) (අ) වගන්තිය | 2011 සිට 2014 දක්වා කාලයට අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ ආදායම් රැස් කිරීමේදී එකතු කල අගය මත බදු ගනුදෙනුකරුවන්ගෙන් අයකර ගෙන නොතිබුණි. අදාල එකතු කල අගය මත බදු රු.93,068,185 ක් සමාලෝචිත වර්ෂයේදී දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවා තිබූ අතර එම බදු මුදල කාර්යාංශයට සිදුවී ඇති අලාභයක් විය. ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ද නොතිබුණි. | මේ වනවිට සියළුම ආදායම් සඳහා වැට් බදු ගෙවීමට කටයුතු කර ඇත. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික | පතල් හා ඛනිජ නිස්සාරණයේදී සමුච්චිත ප්‍රදේශය හෙක්ටයාර 10 ඉක්මවා පොළොව මතුපිට පතල් කැණීම් සිදු නොකල යුතු වුවද ඊට | මෙම පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග නිකුත් කරන ලද්දේ 1993 නොවැම්බර් 26 දිනැති අංක | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | පනතේ 23 V වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යවරයා නිකුත් කල 1993 ජූනි 24 දිනැති අංක 772/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය | පටහැනිව හෙක්ටයාර 18 ක ප්‍රදේශයක ඛනිජ වැලි කැණීම සඳහා අංක IML/A/HO/1623 දරන කැණීම් බලපත්‍රය නිකුත් කර තිබුණි. | 772/22 දැන ගැසට් පත්‍රය මගිනි. එම ගැසට් පත්‍රය හා පනත නිකුත් වීමට පෙර සිට ලංකා ඛනිජ වැලි සමාගම විසින් යන්ත්‍රානුසාරයෙන් කැණීම් කරමින් පැවති අතර එම ගැසට් පත්‍රය මගින් එවකට යාන්ත්‍රිකව කැණීම් කරමින් සිටි බලපත්‍රලාභීන්ට බලපත්‍ර ලබා ගැනීම සඳහා සහන කාලයක් ලබා දී තිබුණි. ඒ අනුව හෙක්ටයාර 10 ක් ඉක්මවන ප්‍රදේශයක් සඳහා එවකට වසර 20 කට වඩා අධික කාලයක් පවත්වා ගෙන ආ මෙම කැණීම් බලපත්‍ර නිකුත් කිරීමට නීතිමය බාධාවක් පැවතුණි. | |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 (2) හා 507 (3) | පිරිවැය රු.1,208,686,416 ක් වූ ස්ථාවර වත්කම් සමීක්ෂණය කර සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | තොග සමීක්ෂණයන් සිදුකොට අදාල වාර්තා මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2)(ආ) හා 371(5) | අවස්ථා 70 කදී රු.100,000 ඉක්මවා රු.810,000 දක්වා අත්තිකාරම් ලබාදීම, විධායක නොවන සේවකයන් 6 දෙනෙකුට අත්තිකාරම් ලබාදීම, කොන්ත්‍රාත් සේවකයින්ට රු.200,000 දක්වා අත්තිකාරම් ලබාදීම, ලබාගත් අත්තිකාරම් නොපියවා තිබියදී නැවත අත්තිකාරම් ලබාදීම නිසා රු.8,600,845 ක් එක් නිළධාරියෙකු අත රඳවාගෙන තිබීම, ලබාගත් අත්තිකාරම් 21 ක් අවුරුදු 1 සිට මාස 1 දක්වා ප්‍රමාද කර පියවා තිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. | හරිත වැලි තොටුපල වැඩසටහන ක්‍රියාත්මක කිරීමට රු.810,000 ක අත්තිකාරම් මුදල ලබාදී ඇති අතර, එය 2019 ජූනි 30 වනවිට පියවා ඇත. මේ වනවිට මාණ්ඩලික නිලධාරීන්ට පමණක් අත්තිකාරම් ලබාදීමට කටයුතු කරන ලෙස කාර්යංශයේ සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ) | ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31.11 හා 31.15 වගන්ති | සාපරාධී චෝදනා යටතේ 2017 අගෝස්තු 17 දින සිට වැඩ තහනමට ලක් කර තිබූ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කර තිබූ අතර වැඩ තහනම් කර තිබූ කාල සීමාවට අදාලව රු.1,386,394 ක අඩ වැටුප් | මෙහිදී අධ්‍යක්ෂ මන්ඩල තීරණය පරිදි කටයුතු කිරීමට සිදුවිය. තවද අදාල නිලධාරීන් සඳහා කරනු ලබන විධිමත් විනය පරීක්ෂණය අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගත වීමත් | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු අතර නීතිරීති වලට පටහැනි |

| | | | | |
|---|---|---|---|---|
| | | හා එක් නිලධාරියෙකුට රු.184,113 ක වෘත්තීය දීමනා රු.505,485 ක දිරිදීමනා හා ප්‍රසාද දීමනා ද ගෙවා තිබුණි. මෙම නිලධාරීන් විනය පරීක්ෂණ නියෝගයක් රහිතව 2019 අගෝස්තු 15 සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත නැවත සේවයේ පිහිටුවා තිබුණි. | චෝදනා පත්‍රයේ ඔවුන් වෙත නගා ඇති චෝදනා සම්බන්ධව සහ ඔවුන්ගේ ඉල්ලීම් සම්බන්ධවද සලකා අඩ වැටුප් ගෙවීමට තීරණය කර ඇත. වෘත්තීය සහ ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධව තවදුරටත් සොයා බලා වාර්තා කරනු ලැබේ. | ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (එ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 6.5.3 ඡේදය | 2017 හා 2018 වර්ෂවල වාර්ෂික වාර්තා 2020 ජුනි 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2018 හා 2017 වර්ෂයේ වාර්ෂික වාර්තා මේ වන විට මුද්‍රණයේ පවතින අතර, කඩිනමින් ඉදිරි කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 8.3.3 ඡේදය | ගෙවියයුතු උපරිම දිරිදීමනාව/ ප්‍රසාද දීමනාව මාස 02 ක දළ වැටුප වුවත් ඊට පටහැනිව මාස 08 ක වැටුපට සමාන දිරිදීමනාවක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සේවකයන්ට ගෙවා තිබුණි. | පීඊඩී 12 හි දක්වා ඇත්තේ දිරි දීමනා (Incentive) පිළිබඳව නොව ප්‍රසාද දීමනා (Bonus) පිළිබඳවය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2003 ඔක්තෝබර් 28 දිනැති අංක පීඊඩී/17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය රහිතව විදේශ සංචාර 07 ක් සඳහා නිලධාරීන් 12 ක් සහභාගී කරවා තිබුණි. | මෙම නිලධාරීන් සඳහා අනියම් දීමනා වීසා ගාස්තු උණුසුම් ඇඳුම් දීමනා සහ පාඨමාලා ගාස්තු පමණක් ගෙවා ඇත. සංයුක්ත දීමනා ගෙවා නොමැත. විදේශගත සීමාව දින 30 ඉක්මවා නොමැති බැවින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඔ) | 2019 සැප්තැම්බර් 30 දිනැති අංක EC/EDR/PRE/INQ දරන මැතිවරණ කොමිෂන් සභාවේ චක්‍රලේඛයේ 03 (iv) හා 03 (v) වගන්ති සහ 2019 සැප්තැම්බර් 18 | පුරප්පාඩු ඉක්මවා සේවකයන් 146 ක් 2019 ඔක්තෝබර් 01 සිට ස්ථිර කර තිබූ අතර මෙහිදී අනුමත සේවා ගණයන්ට ඇතුලත් නොවූ තාක්ෂණික සහකාර තනතුරේ සේවකයන් 5 දෙනෙකුද, ස්ථිර කිරීමට අදාල කොන්දේසි සපුරා නොතිබූ සේවකයන් දෙදෙනෙකුද | මේ වන විට පුරප්පාඩු ඇති සියළු තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළව පුවත්පත් සඳහා දැන්වීම් යොමු කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | දිනැති අංක 29/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ස්ථිර කර තිබුණි. | | |
| (ඕ) | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්එස්/1625 – Vol II දරන ලිපිය | ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමෙන් සේවකයන් ලබා ගැනීමේ ගිවිසුමේ අදාල කොන්දේසි ඇතුලත්ව නොතිබියදී එම සේවකයන්ට රු.3,657,843 ක දිරිදීමනා ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් පැවරුම් පදනම් මත සේවය කරන සේවකයන්ද කාර්යංශයේ ආදායමට දායක වන බැවින් මුදල් අමාත්‍යංශයේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත ඔවුන්ට දිරි දීමනා ගෙවා ඇත . | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.158,266,318 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.391,019,540 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.232,758,222 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම් බදු රු.98,785,974 කින් සහ පරිපාලන වියදම් රු.122,141,847 කින් වැඩිවීම, රාජ්‍ය භාග ආදායම් රු.2,338,784,035 කින්, මූල්‍ය ආදායම් රු.95,173,537 කින් හා ව්‍යාපෘති ආදායම් රු.28,713,738 අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------

| | ාණන නිරීක්ෂණය | ළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | ර්දේශය |
|---|---|---|---|
| :) | )17, 2018 වර්ෂවල අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් භාවිතා කර තිබූ බොරළු කියුබ් 210,666 ක් වෙනුවෙන් අයකල යුතු රාජ්‍යභාග රු.4,213,320 ක් අයකරගෙන නොතිබුණි. | ුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ රජයේ ආයතන මඟින් විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා පස් හා බොරළු කැණීමට බලපත්‍ර ලබාගෙන ඇත. එම බලපත්‍ර යටතේ අනුමත කරන ලද කියුබ් ප්‍රමාණය සඳහා කාර්යංශය විසින් රාජ්‍යභාග අයකර ගෙන ඇත. | ාල රාජ්‍යභාග මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| ා) | ර්ෂ 3 කට පෙර ක්ෂේත්‍ර පරීක්ෂකවරුන්ගේ කාර්ය අධීක්ෂණය කිරීම සඳහා රු.1,176,552 ක් වැයකර මිලදීගත් ක්ෂේත්‍ර පරීක්ෂණ අධීක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදි ඇතිව තිබූ තාක්ෂණික දෝෂ නිවැරදි කරගෙන නොතිබූ අතර පද්ධතිය | මෙම මෘදුකාංගයේ අඩුපාඩු පවතින බැවින් කාර්යංශයට අවශ්‍ය පරිදි එය නැවත යාවත්කාලීන කරන ලෙස එය සකසනු ලැබූ සමාගමට දන්වා ඇත . | ීක්ෂණයන් සිදුකර වාර්තා ලබාදීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | තුලින් අපේක්ෂිත අධීක්ෂණයද නිසි පරිදි සිදුකර නොතිබුණි. | | |
| ැ) | )17 අගෝස්තු 09 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම්දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට විගණිත දින දක්වා කටයුතු කර නොතිබුණි. | ාර්යංශය විසින් ප්‍රතිපත්තිය සකස් කිරීමේ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශය වෙත 2018 ජූලි 14 දින ඉදිරිපත් කර ඇත. අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් පසුව පොදු කැබිනට් පත්‍රිකාවක් වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත භාර දී ඇත. | නිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| ැ) | න්තලේ, සූරියපුර, තුම්මෝදර ප්‍රදේශයේ මහවැලි ගඟේ වැලි නිධි ඉවත් කිරීම සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ආයතනවල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ලි නිධිය ඉවත් කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම ඉවත් කළ යුතු වැලි නිශ්චිත ප්‍රමාණය ඇස්තමේන්තු ගත කර තිබූ අතර අනෙකුත් ආයතනවල නිර්දේශයන්ට යටත්ව ජල ගැලීම් පාලනය කිරීම සඳහා වේල්ලක් ඉදි කිරීම මූලික පරමාර්ථයකොට ගෙන වැලි බලපත්‍රය නිකුත් කර ඇත. | ාල අනුමැතින් ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| ) | මාණවත් මූල්‍ය ශක්‍යතාවයක් නොමැති සමාගමකට 1993 අංක 1 දරන පතල් කැණීම් (බලපත්‍ර දීමේ) නියෝගවල අංක 4(1) නියෝගයට පටහැනිව කරස්නාගල මිනිරන් පතල් ව්‍යාපෘතිය සඳහා අංක EL/222 දරන ගවේෂණ බලපත්‍රය හා අංක IML/A/HO/13219 දරන කැණීම් බලපත්‍රය ලබාදී තිබුණි. ඉහත කැණීම් බලපත්‍රය ලබාදීමේදී හා ගවේෂණ බලපත්‍රය අලුත් කිරීමේදී 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන විදේශ විනිමය නියෝගය ප්‍රකාර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ සමාගමේ පවතින ගිවිසුම පරික්ෂා කර නොතිබුණි. | ලපත්‍ර නිකුත්කරන ලද අවස්ථාවේ මෙම සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබා තිබූ අතර , ආයෝජන ණ්ඩලයේ වලංගුභාවය තවදුරටත් පවතීද යන්න පරික්ෂා කිරීම සඳහා ආයෝජන මණ්ඩලය වෙත ලිපියක් යොමු කර ඇත. තවද යම් ප්‍රමාද දෝෂයකින් මෙම බලපත්‍රය නිකුත් වීම සිදු වී ඇත්නම් ඉදිරියේ මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරනු ඇත. | ධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| ) | හටගහ මිනිරන් පතලේ පැවති අඩුපාඩු හා දුර්වලතා ඒකාබද්ධ පරික්ෂණ වාර්තා මගින් වරින් වර පෙන්වා දී තිබුණද කහටගහ ගුැපයිට් සමාගම විසින් එකී | හටගහ ග්‍රැෆයිට් සමාගම වෙත නිකුත් කරන ලද බලපත්‍රය කොන්දේසි සහිතව නිකුත් කර ඇති අතර අදාල | ඩුපාඩු නිවැරදි කරවා ගැනීමට කටයුතු කල |

| | | |
|---|---|---|
| අඩුපාඩු සහ දුර්වලතා නිවැරදි කරගෙන නොතිබූ අතර ඒ පිළිබඳ සලකා බැලීමෙන් තොරව කාර්යාංශය විසින් කැණීම් බලපත්‍රය අළුත් කරදී තිබුණි. | කොන්දේසීන්ට අනුගතව කටයුතු නොකිරීම හේතුවෙන් කාර්යාංශ අධික්ෂණය යටතේ කැණීම් කිරීම සඳහා බලපත්‍රය නිකුත් කර ඇත. | යුතුය. |

| | | | |
|---|---|---|---|
| ;) | )92 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28(4) වගන්තිය ප්‍රකාරව කළුගල් නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. අදාල විධිවිධානයට පටහැනිව 2019 දෙසැම්බර් 13 දිනැති අංක 19/විවිධ(064) දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වැලි, පස් හා මැටි ප්‍රවාහනය සඳහා 2019 දෙසැම්බර් 4 දින සිට 2020 මාර්තු 16 දක්වා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම නවතා දමා තිබුණි. එම ඛනිජ සඳහා රාජ්‍යභාග ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේදී අයකර ගනිමින් පැවති අතර ප්‍රවාහන බලපත්‍ර අහෝසි කිරීමේදී කැනීම්කරුවන්ගෙන් රාජ්‍යභාග අයකර ගැනීමට විකල්ප ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | ම් වන විට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පොලිස්පතිවරයාට නියම කරන ලද නියෝගයක් මත ප්‍රවාහන බලපත්‍ර සම්බන්ධ නීතිය ක්‍රියාත්මක වීම සිදුවෙමින් පවතී. | නතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| ;ෟ) | )92 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 44(ඍ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ඛනිජ ද්‍රව්‍ය සම්පත්වලට අදාල දත්ත එක්රැස් කිරීමේ, සකස් කිරීමේ, විශ්ලේෂණය කිරීමේ හා පල කිරීමේ බලතල කාර්යාංශයට පැවරි තිබුණද ඒ සඳහා වූ විධිමත් ක්‍රමවේදයක් හෝ වගකීම් පැවරීමක් නොවුණි. | ාර්යංශයේ විස්තර දත්ත එක්රැස් කිරීම , ශ්ලේෂණය කිරීම, සකස් කිරීම හා පල කිරීමට අදාලව වාර්ෂික ඛනිජ වාර්තාවක් සකස් කරනු ලැබේ. 2015 වර්ෂය දක්වා නිකුත් කර ඇත. යම් ප්‍රමාද දෝෂයන් හේතුවෙන් ඉදිරි වර්ෂ සඳහා මෙය සිදු නොවී ඇති අතර මේ වන විට එම සියළු වාර්තා සකස් කිරීමට කටයුතු කරමින් පවතී. | නතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා භාවිතා කල පස් කියුබ් 1,343,810 ක් හා වැලි කියුබ් 3,397 ක් සඳහා පිළිවෙලින් ලැබිය යුතු රාජ්‍යභාග රු.26,876,200 ක් සහ රු.543,490 ක්වූ එකතුව රු.27,419,690 ක් කොන්ත්‍රාත් සමාගමෙන් අයකර ගෙන නොතිබුණි. | කාර්යංශය විසින් හිඟ රාජ්‍යභාග ගෙවන ලෙසට වාරිමාර්ග දෙපාර්තමේන්තුවටද පිටපත් සහිතව අදාල සමාගමට ලිපි කිහිපයක් යවා ඇත. ඊට අමතරව සිහි කැඳවීමේ ලිපි යවා ඇත. | අදාල රාජ්‍යභාග අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කළුගල් කැණීම් ප්‍රමාණය හඳුනාගැනීමට විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය නොකර භාවිත කරන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයක් කැණීම් ප්‍රමාණය ලෙස සලකා රාජ්‍යභාග අයකර තිබීම හේතුවෙන් රාජ්‍යභාග අඩුවෙන් අයවී තිබුණි. 2016, 2017 හා 2018 වර්ෂවල කළුගල් සඳහා කැණීම් බලපත්‍රවල සඳහන් අනුමත ප්‍රමාණයෙන් ද සියයට 65 ක් එනම්, රු.1,427,174,239 ක් අඩුවෙන් රාජ්‍යභාග අයවී තිබුණි. | අදාළ රාජ්‍ය භාගය අය කිරීම් සම්බන්ධව බලපත්‍රලාභීන් දැනුවත් කළ අතර නොගෙවන ලද රාජ්‍ය භාග වෙනුවෙන් රාජ්‍ය භාග අය කිරීම සඳහා නීතිමය පියවර ගෙන ඇත. | අදාල රාජ්‍යභාග අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ඛනිජ වැලි කැණීමට ලංකා ඛනිජ වැලි සමාගම වෙත පුල්මුඩේ, තෙවික්කාලු හා කොඩුවාකට්ටු යන ප්‍රදේශවල වර්ෂ 09 මාස 6 ක කාලයක් සඳහා කැණීම් බලපත්‍ර 03 ක් ද, පුද්ගලික ආයතන 2 ක් වෙත සාම්පූර්, පාලච්චෙනෙයි සහ වෙරුගල් යන ප්‍රදේශවල වර්ෂ 10 ක ක කාලයක් සඳහා බලපත්‍ර 3 ක් ද ලබාදී තිබීම හේතුවෙන් වාර්ෂිකව ලබාගත යුතු වෙරළ සංරක්ෂණ, නාගරික සංවර්ධන හා ප්‍රාදේශීය පරිපාලන ආයතන අනුමැතීන් ලබාගෙන නොතිබූ අතර ඒ මගින් සිදුවිය යුතු නියාමනය සිදුවී නොතිබුණි. ලංකා ඛනිජ වැලි සමාගම බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය වන ආකාරයට හා අනුමත භූමි ප්‍රමාණයන්ද ඉක්මවා කැණීම් කර තිබුණද ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. පෞද්ගලික පාර්ශවයන් 03 ක් වෙනත් ඉඩම්වලින් ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 142,486 ක් බලපත්‍ර රහිතව කැණීම් කර ලංකා ඛනිජ වැලි සමාගමට අලවි කිරීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි. 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ව්‍යාපෘති ගිවිසුමකට එළඹ නොතිබූ සියයට 75 ක අයිතිය විදේශිකයන්ට අයත්ව තිබූ සමාගමකට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාම්පූර් ප්‍රදේශයේ ඛනිජ වැලි කැණීම සඳහා බලපත්‍රයක් නිකුත් කර තිබුණි. | ලංකා ඛණිජ වැලි සමාගම වෙත පුල්මුඩෙයි තෙවික්කාලු හා කොඩුවාකට්ටු යන ප්‍රදේශ වල ඛණිජ වැලි කැණීම් සඳහා කාර්යංශය විසින් කොන්දේසි සහිතව බලපත්‍ර නිකුත් කර ඇත. අදාල ආයතනය විසින් අනුමත භූමි ප්‍රමාණය ඉක්මවා කැණීම් කර තිබූ බැවින් අනුමැතිය නොලත් ප්‍රදේශය සඳහා බලපත්‍ර අයදුම් කරන ලෙස කාර්යාංශය විසින් පසුව උපදෙස් ලබා දී ඇත. මේ වන විට එම ආයතනය බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. පෞද්ගලික පාර්ශව 03 ක් විසින්ඉඩම් වලින් ඛණිජ වැලි කැණීම් කරන බව කාර්යංශය වෙත වාර්ථා වී නැත. | බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය හා බලපත්‍ර රහිතව කරන ලද කැණීම් සම්බන්ධව නීතිමය පියවර ගත යුතුය. |
| (ඈ) | ඛනිජවැලි අපනයනයේදී 2013 ඔක්තෝම්බර් 23 දිනැති 18/33/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත පතල් කැණීම් නියෝග 33 ප්‍රකාරව FOB වටිනාකම මත රාජ්‍යභාග අයකර ගැනීම වෙනුවට ඛනිජවැලි දේශීයව අලෙවි කල වටිනාකමට දේශීය ප්‍රවාහන ගාස්තු එකතු කර සකස් කල මිලක් පදනම් කරගෙන තිබීම නිසා අඩු වටිනාකමක් මත රාජ්‍යභාග අයවී තිබුණි. | පනත හා රෙගුලාසි යටතේ අදාළ රාජ්‍යභාග ගණනය කිරීමට කටයුතු කර ඇත. | පතල් හා කැණීම් නියෝගය ප්‍රකාරව රාජ්‍යභාග අයකල යුතුය. |

මේ හේතුවෙන් ශ්‍රී ලංකා රේගුවද අපනයන වටිනාකම ලෙස එම සකස් කල මිල පදනම් කරගෙන තිබූ අතර රේගු බදු ද අඩුවෙන් අයකර තිබුණි.

### 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව තෝරා ගත් සමාගමක් මගින් 2019-2023 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරවා ගෙන රු.2,581,633 ක් ගෙවා තිබුණි. | 2017 වර්ෂයෙන් පසුව සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබූ බැවින් හා ඉදිරි වසර 3 සඳහා ආයතනික අභිප්‍රාය දැක්වෙන ප්‍රකාශනයක් සකසන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් කාර්යාංශයට දන්වා තිබුණි. කාර්යාංශය තුල එම කාර්යය ඉටු කිරීම සඳහා යෙදවීමට නිලධාරීන් නොමැති වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව වෘත්තීය ආයතනයක් මගින් මෙම සැලැස්ම සකසන ලදි. ඉදිරියට මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට කටයුතු කරමු . | රාජ්‍ය මුදල් සකසුරුවම් ලෙ භාවිතා නොකිරී සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඛනිජ නිධිවල ධාරිතාවය මැනීම සඳහා 2016 වර්ෂයේදී රු.795,000 කට මිලදී ගත් විද්‍යුත් දුර මැණීම් උපකරණයක් භාවිතයට නොගෙන වර්ෂ 3 ක් තිස්සේ නිශ්කාර්යව තිබූ අතර කාර්යාංශයේ දැනට භාවිතා නොවන මුද්‍රක යන්ත්‍ර සඳහා මිලදී ගෙන තිබූ රු.601,640 ක් වූ ටෝනර් ඒකක 43 ක් ප්‍රයෝජනයට ගත නොහැකිව පැවතුණි. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තනි කාර්යයක් ලෙස ඉටුකල යුතු ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය හා ගබඩාව පිහිටි ඉඩම වටා ආරක්ෂක වැටක් ඉදි කිරීම අදියර 3 කින් ඉටුකර එකතුව රු.4,556,463 ක් ගෙවා තිබුණි. පළමු අදියර ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ | මේ වනවිට අදාල නිවැරදි කිරීම් සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාගමෙන් පමණක් මිල ගණන් කැඳවා ගිවිසුමකට එළඹීමෙන් තොරව එම සමාගමට පවරා තිබුණු අතර අනෙක් අදියර දෙක මිල ගණන් කැඳවා ගොවි සංවිධානයකට ලබාදී තිබුණි. මෙහිදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3, 6.3.3, 7.3.4(ආ) , 8.13.3 හා 8.13.4 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා අවශ්‍යතාවය පිළිබඳ නොසලකා රු. 28,000,000 ක් වැයකර ඉඩමක් හා ගොඩනැගිල්ලක් මිලදී ගෙන තිබුණි. මෙකී ගොඩනැගිල්ල අදාල කාර්ය සඳහා භාවිතා කිරීමට සුදුසු නොවීම හේතුවෙන් කාර්යාලය රු. 90,000 ක මාසික කුලියක් යටතේ පවත්වාගෙන ගොස් රු.1,080,000 ක් අතිරේකව වැයකර තිබුණි. | දක්වා ඇති කරුණු සම්බන්ධව ඉදිරියේදී සොයා බලා කටයුතු කරනු ලැබේ. | - එම - |
| (ඇ) | ගම්පහ පිහිටි ප්‍රාදේශීය කාර්යාල භූමියේ රු.6,619,672 ක වියදමින් පාෂාණ සාම්පල රක්ෂිතාගාරයක් හා රසායනාගාරයක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව ඉදිකර තිබූ අතර බිම් මහලේ ඉදිකර තිබූ කාමර 3 න් 2 ක්ම අදාල කාර්යයට නොයොදවා නිලධාරීන් ට වෙන්කර තිබුණි. | දක්වා ඇති කරුණු සම්බන්ධව ඉදිරියේදී සොයා බලා කටයුතු කරනු ලැබේ. | - එම - |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 510 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 701 ක් වීමෙන් තනතුරු 14 ක අතිරික්ත කාර්ය මණ්ඩලය 233 ක් වූ අතර තනතුරු 34 ක පුරප්පාඩු 42 ක් විය. අතිරික්ත කාර්ය මණ්ඩලය අවශ්‍යතා ඇගයීමකින් තොරව සේවයේ යොදවා ගෙන තිබුණි. ඉහල කළමනාකරණ මට්ටමේ තනතුරු 17 ක කිසිඳු ස්ථිර සේවකයෙකු නොසිටි අතර පුරප්පාඩු 22 ක් විය. අනුමත නොවූ තනතුරු 8 ක් සඳහා සේවකයින් 09 ක් බඳවාගෙන තිබුණි. | මේ වන විට පුරප්පාඩු ඇති සියළු තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළව පුවත්පත් සඳහා දැන්වීම් පලකිරීමට කටයුතු කර ඇත. | අවශ්‍යතාවය අනුව තනතුරු සඳහා බඳවා ගැනීම් කල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 ක්‍රියාකාරී සැලසුම්**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) කාර්යාංශයේ එක් එක් අංශවල වාර්ෂික, අර්ධවාර්ෂික හා කාර්තුමය කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යන්හි කාර්යසාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය. | කාර්යාංශයේ එක් එක් අංශ විසින් සකස් කරන ලද වාර්ෂික අර්ධ වාර්ෂික හා කාර්තුමය කාර්යසාධන වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු විසින් අධීක්ෂණය කරන ලදී. | කාර්යසාධන වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කල යුතුයි. |
| (ආ) අධ්‍යක්ෂ (ඛනිජ සමීක්ෂණ) හා අධ්‍යක්ෂ (පතල් සුරක්ෂිතතා) යන තනතුරු වලට අයත් කාර්යභාරයන් ලෙස බඳවා ගැනීමේ පරිපාටිවලින් නියම කර තිබූ ඉදිකිරීම් සඳහා විකල්ප අමුද්‍රව්‍ය කෙරෙහි යොමු කිරීම, පතල් ක්ෂේත්‍රයේ පාරිසරික උපද්‍රව අවම කිරීම, ඛනිජ නිස්සාරණය හා ඒ මත පදනම් වූ නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම, සමාජීය හා පාරිසරික ගැටලු විමර්ෂණ සිදුකිරීම හා විසඳුම් සෙවීම යන කාර්යයන් ඉටු කිරීම සඳහා වූ සැලසුම් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට ඇතුලත් කර හෝ ඉටු කර නොතිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදී පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රමවේද අනුගමනය කිරීම අධ්‍යක්ෂ (පාරිසරික බලපෑම් ඇගයීම්) වෙත පැවරි තිබුණද ඊට අදාලව කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ (ඛනිජ සමීක්ෂණ) හා අධ්‍යක්ෂ (පතල් සුරක්ෂිතතා) අදාල අධ්‍යක්ෂවරුන් වෙත බඳවාගැනීමේ පටිපාටියට අදාලව රාජකාරි ලැයිස්තු ලබා දී ඇත. | වගකීම් ක්‍රියාකාරී සැලසුම්වලට ඇතුලත් කර ඉටු කිරීමට කටයුතු කල යුතුය. |